シンハラ語

සිංහල අනුවාදය

# විදේශිකයන් වෙත

## මහජන සෞඛ්‍ය රක්ෂණය පිළිබඳ දැනගන්න




මහජන සෞඛ්‍ය රක්ෂණ අංශය (පුනබෂි නගර සභාව 1 වන මහල)

දුරකථන 047-436-2395

# ජපානයේ සැම දෙනාම පොදු වෛද්‍ය රක්ෂණ ක්‍රමයට සම්බන්ධ වේ

ජපානය තුළ සිත් සැහැල්ලුවෙන් තම ප්‍රතිකාර ලබා ගැනීමට පිණිස සියලුම ජනයා නිළ වශයෙන් වෛද්‍ය ප්‍රතිකාර රක්ෂණ ක්‍රමයට ඇතුලත් කර ඇත. ඒ අනුව මහජන සෞඛ්‍ය රක්ෂණය ඒ ආකාරයේ නිල වශයෙන් ඇති වෛද්‍ය ප්‍රතිකාර රක්ෂණ ක්‍රමයේ එක් අංශයක් වේ. යම් අයුරකින් රෝගාබාධ මෙන්ම අනතුරු වලින් තුවාල සිදු වීම් ආදිය ද ආවරණය වන පරිදි සකස් කර ඇත. රක්ෂණයට ඇතුලත් වී සිටින පුද්ගලයන් ඒ සඳහා තම රක්ෂණ මුදල් ගෙවා ඒ මගින් තම ආරක්ෂාව ආවරණය කරන පරිදි සකස් කර ඇති ක්‍රමවේදයක් වේ.




Q　අපි වැනි විදේශිකයන් ඒ සඳහා ඇතුලත් වීම නොකරන්නේ නම් නුසුදුසු ද?

එය එසේමයි.

මාස 3 කට වඩා ජපානයේ නේවාසිකව පදිංචිව සිටීමට තීරණය කළ විදේශ පුරවැසියන් (සංචාරය සඳහා වන වීසා බලපත්‍රය හැරෙන්නට වීසා බලපත්‍ර ලබාගෙන ඇති විදේශ පුරවැසියන්) සියලුම දෙනා මහජන සෞඛ්‍ය රක්ෂණයට අනිවාර්යයෙන් ම ඇතුලත් විය යුතුයි.

# රක්ෂණ පත්‍රය නිකුත් කරනු ලබයි

මහජන සෞඛ්‍ය රක්ෂණයට ඇතුලත් වුවහොත් ඔබටද රක්ෂණ පත්‍රය නිකුත් කරනු ලබයි. රක්ෂණ පත්‍රය නේවාසික පදිංචි සහතික පත්‍රය මෙන්ම ඉතාමත් වැදගත් දෙයක් වේ. අනිවාර්යයෙන්ම හැම නිතර ම තමා වෙතම තබා ගන්න.

## මොනම ආකාරයෙන්වත් නොකළ යුතු ක්‍රියාවන්

× වෙනත් අයෙකුගේ රක්ෂණ පතක් භාවිතයට ලබා ගැනීම හා අන් අයෙකුට තම පත්‍රය භාවිතයට ලබා දීම නොකළ යුතුයි.

× රක්ෂණ පතෙහි අන්තර්ගතය තමා විසින් ලියා වෙනස් වීම් ආදිය නොකළ යුතුයි.

➡ මෙවැනි නීති විරෝධී ක්‍රියා වන් සිදු කළහොත් නීතියෙන් ස්ථාපිත දඬුවම් ව ලට ලක් වේ

<මෙවැනි අවස්ථාවකදී රක්ෂණ පත භාවිතා කළ නොහැක>

ශාරීරික හැඩය වෙනස් කිරීමේ රූපාලංකාර ශල්‍යකර්ම මෙන්ම මුඛයේ දත් පෙළේ පිහිටීම් හැඩය වෙනස් කිරීම ආදියේ මෙන් ම රෝගාබාධ හා අනතුරු වලින් තුවාල සිදු වීමක් නොවන විටකදී රක්ෂණ පත්‍රය භාවිතා කිරීම කළ නොහැක.

# රක්ෂණ පතක් තිබන විට කුමන ආකාරයේ ධනාත්මක අගයන් තිබේද ?

ඔබ රෝගාබාධ මෙන් අනතුරු වලින් තුවාල වී පීඩාවට පත්වන විට අදාල ප්‍රතිකාර ස්ථානයේ කාර්යාලය වෙත තම රක්ෂණ පත්‍රය පෙන්නූ විටක, වෛද්‍ය ප්‍රතිකාර වියදමින් එක කොටසක් (සාමාන්‍යයෙන් 30% ක්) ගෙවීමෙන් ප්‍රතිකාර ලැබීම මෙන්ම ඖෂධ ලබාගැනීමට හැකියාව ඇත. (ඉතිරි 70% නගර සභාව විසින් දරණු ඇත.)

<උදාහරණ ලෙස වෛද්‍ය ප්‍රතිකාර ගාස්තුව යෙන් 5,000 ක් වූ විටක>

| රක්ෂණ පත පෙන්නූ විට | රක්ෂණ පත නොපෙන්නූ විට |
| --- | --- |
| ↓ | ↓ |
| යෙන් 1,500 වේ<br>30% ක් පමණක් ගෙවීම ප්‍රමාණවත්ය | යෙන් 5,000 ＋ α<br>100% ම තමා විසින් ම ගෙවිය යුතුයි. |

# රක්ෂණ ගාස්තුව ගෙවීම අනිවාර්ය වේ

මහජන සෞඛ්‍ය රක්ෂණයට ඇතුලත් වන පුද්ගලයන් තමන්ගේ මුදල් (රක්ෂණ ගාස්තුව) ගෙවීම මගින්, වෛද්‍ය ප්‍රතිකාර වලට යන මුදල් ආවරණය කරනු ලැබේ.

මහජන සෞඛ්‍ය රක්ෂණ යනු, යම් අයුරකින් රෝගාබාධ මෙන්ම අනතුරු වලින් ඇති වන තුවාල ආදිය ආවරණය කරන අතර, ඒ මගින් සියලු දෙනාට ම උපකාර වන ක්‍රමවේදයකි.

# රක්ෂණ ගාස්තු ගණනය කිරීමේ ක්‍රමවේදය

රක්ෂණ ගාස්තු යනු (මූලික ගාස්තු ) සහ (ජපානයේ දී ලබන ආදායමට [වැටුප] අනුකූල වූ මුදල) එකතු කරගත් මුළු මුදල වේ.

මූලික මුදල
එක වසරක් සඳහා
යෙන් 30,000 සිට
40,000

＋

ආදායම (වැටුප)
අදාළ වූ මුදල

1 වසරකට
ආදායමින් 10% ක්

＝







මගේ රක්ෂණ ගාස්තුව කීයක් පමණ වෙනවාද？

ජපානයට පැමිණ වසර 1 දී → වසර 1 කට
සාමාන්‍යයෙන් යෙන් 10,000

ජපානයට පැමිණ පලමු වසරේ දී, එනම් පෙර වර්ෂයේ ආදායම (වැටුප්) නොමැති නිසා, මූලික ගාස්තුව පමණක් ගෙවනු ලබයි. ජපානයේ ආදායම් අඩු ලාභීන්, නගර සභාවට ලියකියවිලි ඉදිරිපත් කරීමෙන්, මූලික ගාස්තුව 70% දක්වා අඩුකිරීම නිසා එක් වර්ෂයක රක්ෂණ ගාස්තුව ඉතාමත් අඩුය. (පිටු 4 වඩා විස්තර)

ජපානයට පැමිණ වසර 2 කට පසු

(උදා) එක මසකට අර්ධ කාලීන රැකියාවෙන් යෙන් 120,000 ලබාගත් විටක

→ වසරකට සාමාන්‍යයෙන්
යෙන් 80,000

ජපානයේ දී ආදායම (වැටුප) වැඩිවන විට දෙවන වසර සිට (ආදායමට [වැටුප] අදාල මුදල් ප්‍රමාණය) ගෙවීම අනිවාර්ය වේ. ඒ සඳහා, ජපානයට පැමිණි දෙවන වසරේදී රක්ෂණ මුදල වැඩිවීමට භාජනය වන පුද්ගලයන් රාශියක් ඇත.

උදාහරණ ලෙසට, එක මාසයකට අර්ධ කාලීන රැකියාවෙන් යෙන් 120,000 ලෙසට වැටුප ලබන විටකදී, එක වසරකට යෙන් 80,000 ක රක්ෂණ ගාස්තුවකට යටත් වේ.

# රක්ෂණ මුදල් කුමන අයුරින් ගෙවනු ලබන්නේද ?

රක්ෂණයට ඇතුලත් කිරීමේ ලියකියවිලි අවසන් වූ පසු, පුනබෂි නගර සභාව වෙතින් තම ලිපිනය වෙත මුදල් ගෙවීමේ ඉල්ලුම් පත්‍රය (ආදායම් ගෙවීම් පත්‍රය) එවනු ලබයි.

මුදල් ගෙවීමේ ඉල්ලුම් පත්‍රය (ආදායම් ගෙවීම් පත්‍රය) ලැබූ විට, සඳහන් කරන ලද කාලය තුලදී බැංකු, කොන්වීනියන් ස්ටෝරු මගින් ගෙවීම් කරන්න.

- ඊලඟ වසරේ සිට, සෑම වසරක ම ජූනි මස 15 දින එක වසරක මුදල් ගෙවීමේ ඉල්ලුම් පත්‍රය (ආදායම් ගෙවීම් පත්‍රය) ලිපිනයට එවනු ලබයි.

රක්ෂණ ගාස්තුව, (වාර්ෂික ගෙවීම ලෙස) මෙන්ම (මාසිකව ජූනි මස සිට මාර්තු දක්වා 10 වාරයක් ගෙවීම) යටතේ ගෙවනවාද යන්න තෝරා ගත හැකිය

**එකවර ගෙවීම**

මාසිකව ගෙවීම සමහර විට අමතක විය හැකිය. මම නම් එකවර මුදල් ගෙවීම් මගින් ගෙවීම කරන්න සූදානම්!



## එසේම

එකවර ගෙවීම අපහසු නිසා සෑම මසකට එකවරක් ගෙවීම් කරනවා. සෑම මාසයකටම එම ගෙවීම් කිරීමට අමතක නොවන ලෙසට සැළකිලිමත් වෙන්න.



**අගොස්තු මස කොටස**

**ජූලි මස කොටස**


**ජූනි මස කොටස**

★ ගෙවීම් පත්‍රිකාවේ නියමිත කාලය වනුයේ සෑම මාසයකම අවසානය වේ. (මේ අවසාන දිනය සෙනසුරාදා, ඉරිදා මෙන්ම වෙනත් නිවාඩු දිනයක් නම් නැවත රාජකාරී දිනය) වේ. දෙසැම්බර් මාසය පමණක් 25 වන දිනය නියමිත දිනය වන නිසා සිහියට තබා ගන්න.

★ගෙවීම් කරනු ලබන ස්ථාන වනුයේ බැංකු, කොන්නියන් ස්ටෝරු, මහජන සෞඛ්‍ය රක්ෂණ අංශය (පුනබෂි නගර සභා 1 වන මහල එසේත් නැතිනම්, ෆේස් ගොඩනැගිල්ලෙහි 5 ස් වන මහලෙහි 6 වන කවුලුව) වේ.

★නියමිත කාලය ඉක්මව ගිය විටක, කොන්වීනියන් ස්ටෝරු භාවිතා කළ නොහැක. අනිවාර්යයෙන්ම නියමිත කාලය ඉක්මවීමට පෙර ගෙවීම් සිදු කරන්න.

# ගෙවීම් ලේඛනයෙහි සැලැස්ම






දෙවන වසරේ සිට මහජන සෞඛ්‍ය රක්ෂණ මුදල් ගෙවීම අමතක වූ විටක පසුව එකතු කිරීම් යටතේ ගෙවීම කිරීමට සිදු වේ. එකවරට ම ගෙවීම අපහසු බැවින්, සෑම මසකම, අමතක නොකොට මහජන සෞඛ්‍ය රක්ෂණ මුදල් ගෙවීම් කරන්න.

# නිවැරදිව ආදායම (වැටුප) දැනුම් දීම කරමු

රක්ෂණ ගාස්තුව, පෙර වසරේ ආදායමට （වැටුප） සම්බන්ධව ගණනය කොට තීරණය වන නිසා ආදායම් දැනුම් දීම් ප්‍රකාශනය වැදගත් වේ.



## වාර්ෂිකව ආදායම් ප්‍රකාශන දැනුම් දිය යුතුද?

සැම දෙනාට ම ගෙවනු ලැබූ ආදායම （වැටුප） පමණක් සම්බන්ධයෙන් රාජකාරී ස්ථානයෙන් නගර සභාවට ප්‍රකාශ කිරීම කරනු ලබන අතර තමා විසින් ම එවැනි ආදායම් ප්‍රකාශනයක් කිරීම අත්‍යවශ්‍ය නොමැත.



## කුමන අවස්ථාවකදී ප්‍රකාශන කිරීම අත්‍යවශ්‍ය ද?

<ප්‍රකාශන කිරීමේ අත්‍යවශ්‍ය අවස්ථා>

① ජපානයට පැමිණි පළමු වසරේදී ප්‍රකාශනය කිරීම අත්‍යවශ්‍ය වේ.

- රක්ෂණ පත නිකුත් කිරීමේදී පෙර වර්ෂයේ ආදායම （වැටුප） නොමැති වීම මත වුවද ප්‍රකාශනය කිරීම කළ යුතු වුවද, ප්‍රකාශනය නොකරන විටක, ලියකියවිලි අත්‍යවශ්‍ය වේ. රක්ෂණ ගාස්තුව අඩු වීමකටද ලක්විය හැකිය. （වැඩි විස්තර පිටු අංක 2）

② ආයතනයක රාජකාරී කරන විටක, ආයතනය මගින් නගර සභාවට, ඔබගේ ආදායම (වැටුප) ප්‍රකාශණය නොකරන විටකදී, ආදායම (වැටුප) නිශ්චය කිරීම කළ නොහැකි විටක, තමා විසින් ම ප්‍රකාශණය කිරීම අත්‍යවශ්‍ය වේ.



## කොහොමද ප්‍රකාශන කළ යුත්තේ?

ජනවාරි මස පළමු දින අවස්ථාවේදී ෆුනබෂි නගරයේ ජීවත් විය.

- ඔව් → පුරවැසි බදු ප්‍රකාශන පත්‍රයෙන් ප්‍රකාශ කරමි <පුරවැසි බදු අංශයේ (ෆුනබෂි නගර සභා 2 වන මහල) දී ප්‍රකාශන කරමි>
- නැත → ජනවාරි මස 1 වන දින වන විට ජපානයේ වෙනත් නගර සභා, ප්‍රාදේශීය සභා, ග්‍රාමීය සභා ප්‍රදේශයක ජීවත් වෙමි.
  - ඔව් → ජනවාරි මස පළමු දින ජීවත් වූ නගර සභා, ප්‍රාදේශීය සභා, ග්‍රාම සභා ප්‍රදේශයේ දී ප්‍රකාශන කරමි. ඉන් පසුව, ෆුනබෂි නගරය ජනවාරි පළමු දින ජීවත් වූ ප්‍රදේශයේ ආදායම බලන බැවින් ප්‍රකාශණයෙන් පසුව මහජන සෞඛ්‍ය රක්ෂණ අංශය (ෆුනබෂි නගර සභා 1 මහල) ප්‍රකාශනය කිරීමෙන් අනතුරුව දැනුම් දීම කරන්න.
  - නැත ↓

රක්ෂණ මුදල ආදායම් ප්‍රකාශන පත්‍රයෙන් (නිරීක්ෂණ) ප්‍රකාශනය කරමි. <මහජන සෞඛ්‍ය රක්ෂණ අංශය (ෆුනබෂි නගර සභා 1 මහල) වෙත ප්‍රකාශනය කිරීම>

- තැපැල් මගින් ආදායම් ප්‍රකාශණය කිරීමට අදහස් කරන පුද්ගලයන් වෙත ආදායම් ප්‍රකාශණ පත්‍රිකාව එවන බැවින්, දුරකථන (047-436-2395) වෙත සන්නිවේදනය කරන්න.

年度国民健康保険料所得申告（調査）書

［　●　年1月～12月の所得状況　］

平成　年　月　日　　船橋市長　あて

| | | | | | |
|---|---|---|---|---|---|
| 記号番号 | 1234567 | 宛名番号 | | 届出日 | 年 1 月 6 日 |
| ① 現住所 | 船橋市　湊町2－10－25 | ③ 氏名 | HOANN TAI　印 | ⑤ 電話番号 | |
| ② 1月1日の住所 | 海外（ベトナム） | ④ 生年月日 | 明・大・昭・平　1998 年 4 月 1 日 | | 080-0000-0000 |
| ⑥ 給与収入 | 年間総収入　0 円 | ＊税込の総収入です | | | |
| 年金収入 | | ＊遺族・障害・老齢福祉年金は除く | | | |
| 収入の無かった人の | | | | | |

<සටහන් කිරීමේ විදිය>

① ෆුනබෂි නගරයේ ලිපිනය.

② ●වසරේ ජනවාරි පළමු දින විදේශයක සිටියේ නම් ( පිටරට [රටෙහි නම] ) යනුවෙන් සටහන් කරන්න (උදා:) (පිටරට [වියට්නාමය] ).

③ නම(නේවාසික පදිංචි කාඩ් පතෙහි සඳහන් අයුරු.)

④ උපන් දිනය (උදා:) 1998 අප්‍රේල් මස 1 වන දින .

⑤ දුරකථන *ජංගම දුරකථන භාවිතා කරයි නම් එම අංකය.

⑥ ● වසරේ ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා ජපානයේ දී ආදායම් මාර්ගයක් නොමැත් නම් ( 0 ) යනුවෙන් සටහන් කරන්න.

පිට රටක සිට ජපානයට පැමිණි පුද්ගලයන්, වෙනත් තැනක මාරුවීම සඳහා වන ලියකියවිලි ඉදිරිපත් කරන විටක, ආදායම් ප්‍රකාශන (නිරීක්ෂණ) පත්‍රය ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. අමතක නොකොට එය ඉදිරිපත් කරන්න



## නියමිත කාලසීමාව තුලදී බදු ගෙවීම් කල නොහැකි පුද්ගලයන්, ඉක්මන් කර උපදෙස් සේවා ලබා ගන්න

**රක්ෂණ ගාස්තු නොගෙවා සිටිය හොත් ...**

**1**

හිග මුදල් තව තවත් වර්ධනය වේ. ප්‍රතිකාර සඳහා ගෙවන ගාස්තුව සාමාන්‍ය ගාස්තුවට වඩා වඩාත් වැඩි වේ.

ගෙවීම් ලබාගැනීම සඳහා, ඔබගේ ගෘහය වෙතට පැමිණෙයි.
ඔබගේ ජංගම දුරකථනයට කථා කොට රක්ෂණ මුදල් ගෙවන ලෙස ඉල්ලීම් කරනු ලබයි

**2**

**රක්ෂණ පත්‍රයේ වලංගු කාල සීමාව අඩු කිරීම සිදු වේ.**

- **සාමාන්‍යයෙන් වාර්ෂිකව එය ස්වයංක්‍රියව නැවත අලුත් වන අතර, රක්ෂණ ගාස්තු නොගෙවූ විටක ,**
**මාස 4 කට වරක් මහජන සෞඛ්‍ය රක්ෂණ අංශය (පුනබෂි නගර සභාව 1 වන මහල) වෙත පැමිණ, රක්ෂණ පත්‍රය නැවත අලුත් කිරීම අත්‍යවශ්‍යම වේ.**
**නැවත අලුත් නොකලහොත්, ප්‍රතිකාර ස්ථාන වලදී රක්ෂණ පත්‍රය භාවිතා කිරීමට හැකියාව නොමැත.**

**3**

**තමාට අයත් ඉතිරි කිරීම් බැංකු ගිණුම් තිබුනද, ඒවා නිදහසේ භාවිතා කිරීමට හැකියාව නොමැත. තමා වෙතට ගෙවනු ලබන වැටුප් ග්‍රහණය කිරීමට සිදුවේ.**

## තමාගේ රටේ මව් භාෂාවෙන් කථා කල හැකිය




රූපවාහිනී දුරකථන සේවා භාවිතා කොට තම රටේ තම මව් භාෂාවෙන් කතාබස් කල හැකිය.

<රූපවාහිනී දුරකථන මගින් භාෂා පරිවර්තනය කිරීමට හැකි වේලාවන්>

| | |
|---|---|
| ඉංග්‍රීසි, චීන, කොරියා, ස්පාඤ්ඤ, රුසියා, තායි | **9:00-17:00** |
| වියට්නාම්, පිලිපීන, ප්‍රංශ | **10:00-17:00** |
| නේපාල, හිංදි | **11:00-17:00** |

< විස්තර ලබා ගැනීම හා සන්නිවේදන >

මහජන සෞඛ්‍ය රක්ෂණ අංශය (පුනබෂි නගරසභාව 1 වන මහල)

☎දුරකථන **047-436-2395　9:00-17:00**（සෙනසුරාදා, ඉරිදා සහ නිවාඩු දින හැර）

- දුරකථන ඇමතුම්, ජපන් භාෂාව පමණක් සනිවේදන මාධ්‍ය වේ.

## ගෙවීම් කිරීම, භාවිතා කරන බැංකු ගිනුම් වෙතින් සෘජුව බැර කිරීම !

ජපානයට පැමිණ වසර දෙකකින් පසුව මහජන සෞඛ්‍ය රක්ෂණ ගාස්තුව ගෙවීම් කිරීම අමතක කලහොත්, ඉන්පසුව එම මුදල් එකවර ගෙවීම නොකරන්න. හිග මුදල් එකවර ගෙවීම යනු ඉතාමත් දුෂ්කර කර්යයක් වන නිසා, මාසිකව අමතක නොකොට රක්ෂණ ගාස්තු ගෙවීම කරන්න. මහජන සෞඛ්‍ය රක්ෂණ ගාස්තු, තම භාවිත බැංකු ගිණුම් මගින් ගෙවීම් කිරිම පිනිස ඔබව උනන්දු කරමු.

බැංකු ගිණුම් මගින් සෘජුව බැර කිරීම් ඉල්ලීම් පහත සඳහන් ①② යන ක්‍රම දෙකෙන් කුමන ක්‍රමයකට හෝ කල හැකිය.

**1 තම බැංකුවේ ණයවර පතින් බැර කිරීමට ඉල්ලීම.**

ගිණුම් සඳහා වන තම සහතික නිල මුද්‍රාව නොමැති වුවද, බැංකු ණයවර පතින් පමණක් මහජන සෞඛ්‍ය රක්ෂණ ගාස්තුව ගිණුම් මගින් සෘජුව ගෙවීම සඳහා ඉල්ලීම් කල හැකිය. (සෙයිතයි නින්ෂො 1C ණයවර පත් භාවිතා කල නොහැක). ගෙවීමට කැමති පුද්ගලයන් ණයවර පත්‍රය හා රක්ෂණ පත්‍රය රැගෙන මහජන සෞඛ්‍ය රක්ෂණ අංශය (පුනබෂි නගර සභා කාර්යාල ගොඩනැගිල්ල 5 වන මහලේ 6 වන කවුළුව) වෙත පැමිණ ලියකියවිලි සකස් කර ගන්න.

<සේවාවන් සිදු කරන බැංකු>

චිබා ගින්කෝ, මිසුහෝ ගින්කෝ, මිට්සුබිෂි UFJ ගින්කෝ, මිට්සුයි සුමිතොමෝ ගින්කෝ, රිසෝනා ගින්කෝ, චිබා කෝගියෝ ගින්කෝ, තොචි ගින්කෝ, යුචෝ ගින්කෝ, චිබා ෂින්යො ගින්කෝ, තෝකියෝ බේ ෂින්යො ගින්කෝ

- සේවා සපයන බැංකුවල වෙනස්කම් ද සිදුවිය හැකිය.

බැංකු ණයවර පත රැගෙන නගර සභාව වෙත පැමිණීමෙන් ගිණුම් මගින් සෘජු ගෙවීම් සඳහා වන ලියකියවිලි සකස් කර ගත හැකිය.




**2 ගිණුම් මගින් සෘජුව ගෙවීම් සඳහා වන ඉල්ලුම් පත්‍රය (චිත්‍ර සහිත ලිවීම් පත්‍රිකාව) මගින් ඉල්ලා සිටීම.**

පහත සඳහන් අයිතමයන් රැගෙන පුනබෂි නගරසභාව විසින් අනුමත බැංකුව (යුචෝ ගින්කෝ පමණයි) වෙත ගොස් ලියකියවිලි සකස් කර ගන්න.

① මහජන සෞඛ්‍ය රක්ෂණ පත්‍රිකාව. ② බැංකු ගිණුම් පොත. ③ බැංකු පොතෙන් මුදල් ගැනීමේ නිල මුද්‍රාව.

## මෙවැනි අවස්ථාවල දී, ලියකියවිලි අත්‍යවශ්‍ය වේ.

**◆ලිපිනය වෙනස් වූ විට නගර සභාව වෙත ඒ පිළිබඳ දැනුම් දීම අනිවාර්ය වේ.**

පුනබෂි නගරයෙන් වෙනත් විදේශයකට පදිංචියක් සඳහා පිටත්ව යාම (ජපානයේ ජීවත් නොවන විටකදී)

⇒ පුනබෂි නගර සභාවට රක්ෂණ පත ආපසු බාර දෙන්න.

පුනබෂි නගරයේ සිට ජපානයේ වෙනත් නාගරික, ප්‍රාදේශීය, ග්‍රාමීය, වීදි බල ප්‍රදේශයකට පදිංචිය සඳහා පිටත්ව යාම.

⇒ පුනබෂි නගරය, නගර, වීදි, ප්‍රදේශ, ග්‍රාම ආදී තම බල ප්‍රදේශ වල පිහිටි ස්ථාන වලින් මෙම රක්ෂණ පත්‍රය නිකුත් කරයි. ඒ අනුව පුනබෂි නගර සභාව වෙත තම රක්ෂණ පත්‍රය ආපසු බාර දී, පදිංචිය සඳහා යන නගර, වීදි, ප්‍රාදේශීය, ග්‍රාම යන බල ප්‍රදේශ වල ඇති අදාල ස්ථාන වලින් නව රක්ෂණ පත්‍රිකාව ලබා ගන්න.

පුනබෂි නගරයේම වෙනත් ලිපිනය පදිංචිය පිණිස පිටත්ව යාම

⇒ පැරණි රක්ෂණ පත්‍රිකාව ආපසු බාර දී, නව ලිපිනය සටහන් කරගත් අලුත් රක්ෂණ පත්‍රිකාවක් ලබා ගන්න.

**◆තම රාජකාරි ස්ථානයේ සෞඛ්‍ය රක්ෂණයට ඇතුල් වුවහොත් මහජන සෞඛ්‍ය රක්ෂණ පත භාවිතා කල නොහැක.**

මහජන සෞඛ්‍ය රක්ෂණ අංශය (පුනබෂි නගර සභාව පලමු මහල) දී මහජන සෞඛ්‍ය රක්ෂණ පත්‍රය අවලංගු කිරීමේ ලියකියවිලි ඉදිරිපත් කොට, එම මහජන සෞඛ්‍ය රක්ෂණ පත්‍රිකාව ආපසු බාර දෙන්න. අවලංගු කිරීමේ ලියකියවිලි ඉදිරිපත් නොකරන්නේ නම්, රක්ෂණ ගාස්තු ගෙවීම සඳහා වන ඉල්ලුම් පත්‍රය එවීම නැවැත්විය නොහැක. ඒ නිසා අනිවාර්යයෙන්ම ලියකියවිලි ඉදිරිපත් කරන්න.

**◆නේවාසික පදිංචි සහතික පතේ වලංගු කාලය ඉවත් වූ විටක, මහජන සෞඛ්‍ය රක්ෂණ පත්‍රයේ ජපානයේ ඇති නගර, වීදි, ප්‍රදේශ, ග්‍රාම යන බල ප්‍රදේශ තුළ ලියාපදිංචි නොවී සිටී නම්, රක්ෂණය සඳහා ඇතුලත් වීමට නොහැකි ක්‍රමයක් වේ.**

යම් අයුරකින් නේවාසික පදිංචි සහතික පත්‍රය අලුත් කිරීම අමතක වී, එම නේවාසික පදිංචි සහතික පත්‍රය කාලය ඉක්මව ගියහොත්, පුනබෂි නගර සභාවේ එම ලියා පදිංචිය අවලංගු වන අතර, රක්ෂණ පත්‍රය භාවිතා කිරීමට ද නොහැකිය.

අමතක නොකොට ලියකියවිලි ඉදිරිපත් කරන්න



発行年月：平成３０年（２０１８）９月
制作・発行：船橋市　健康福祉局　健康・高齢部　国民健康保険課
翻訳・編集：株式会社メリットファイブ
このパンフレットの著作権は船橋市に帰属します。船橋市の許可なく、パンフレットの一部または全部を、複製、転載または配布、印刷など、第三者の利用に供することを禁止します。
©２０１８　船橋市